**දෝෂ නිරාකරණය**

පරිගණක ගැටලුවක් විසඳා ගනු ලබන්නේ කෙසේ ද යන්න නිරූපණය කරන ක්‍රියාවලිය දෝෂ නිරාකරණය ලෙස හඳුන්වනු ලැබේ.

**පරිගණක දෝෂ නිරාකරණයේ දළ විශ්ලේෂණය**

පහත පියවර අනුගමනය කිරීම බොහෝ පරිගණක ගැටලු හඳුනා ගැනීමට උපකාරී වේ.

1. පරිගණකය ක්‍රියාත්මක වී තිබෙන්නේ ද?
2. කිසියම් දෝෂ පණිවිඩයක් පෙන්නුම් කරන්නේ ද?
3. පරිගණකය නැවත ආරම්භ කරන්න.
4. නව මෘදුකාංගයක් හෝ දෘඩාංගයක් එකතු කර තිබෙන්නේ ද?
5. පරිගණකය චලනය කර තිබෙන්නේ ද?
6. යම්කිසි විදුලි බලය ඇනහිටීමක් හෝ විදුලි කුණාටුවක් ඇති වී තිබෙන්නේ ද?
7. නැවත සම්බන්ධ කර විදුලිබල රැහැන් පරීක්ෂා කරන්න.
8. ධාවක (drivers) යාවත්කාලීන කරන්න. නැත හොත් නවතම සවිමාවන් (patches) ස්ථාපනය කරන්න.
9. අනිෂ්ට මෘදුකාංග සහ වයිරස සඳහා පරිලෝකනය කරන්න.
10. කිසිදු ගැටලුවකින් තොරව අවසන් වරට පරිගණකය ක්‍රියාත්මක වූයේ කවරදා ද?
11. වෙනත් පරිගණක දෘඩාංග සහ මෘදුකාංග දෝෂාවේක්ෂණ



**පරිගණක දෘඩාංග ගැටලු**

- යතුරුපුවරුව
- මූසිකය
- විදුලිරැහැන
- ජාලකරණ රැහැන
- VGA රැහැන

**ශබ්ද ප්‍රතිදාන ගැටලු**

- ස්පීකර සම්බන්ධතා
- හඬ ප්‍රමාණය පරීක්ෂාව

**පරිගණක කෙවෙනි සම්බන්ධතා**

- PS/2
- USB
- Micro USB
- VGA
- HDMI
- සමාන්තර
- RJ45
- මතක කාඩ්පත්




*රූපය 2.2.1 විදුලි බල රැහැන් සම්බන්ධතාව*